පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 79

ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொகுப்பு இலக்கம் : 79

நிறுவனத்தின் பெயர் : மாவட்ட செயலகம், அநுராதபுரம்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliament Publication Collection No: 79

Name of the institution : District Secretariat, Anuradhapura

Submission of observation of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No 119(4)

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119(4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

රා.ගි.කා.සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මහපෙන්වීම්	ගණන්දීමේ නිලධාරි විසින් ගත් ක්‍රියාමාර්ග	වර්තමාන ප්‍රගතිය
2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමුවන මුරපදය ගණකාධිකාරී හෝ අවසරලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි.	පළමු මුරපදය ගණකාධිකාරී විසින් පමණක් භාවිතා කරන ලද අතර විෂයභාර නිලධාරි විසින් දෙවන මුරපදය භාවිතා කරන ලදී.	චක්‍රලේඛ පරිදි කටයුතු කරනු ලැබේ.
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර නොතිබුණි. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.	2022 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන මත අනුමත වූ බොහෝ ව්‍යාපෘති එම කාල පරිච්ඡේදයේ රටේ පැවැති දේශපාලන, ආර්ථික හා සමාජීය අර්බුද හමුවේ සම්පූර්ණයෙන් නවතා දමන ලද අතර සමහර වැඩසටහන්වල ඒ වන විටත් වැඩ ආරම්භ කර තිබූ ව්‍යාපෘති පමණක් ක්‍රියාත්මක වී ඇත. මෙම කරුණු පදනම් කරගෙන 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර නොමැති අතර එහෙත් 2022 වර්ෂයට අදාළ අවසන් ප්‍රගති වාර්තාව පමණක් සකස් කර තිබුණි.	මේ වන විට 2024 වර්ෂයට අදාළව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කර ඇත.
2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේ අපහරණය කරන ලද කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ පිළිබඳ තොරතුරු හා 2022 වර්ෂයේ මිලදී ගන්නා ලද උපකරණ හා ගෘහභාණ්ඩ පිළිබඳ තොරතුරු ද මගේ අංක ANU/DIST/2/19/1/B/1 හා 2022.12.31 දිනැති ලිපිය මඟින් කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.	01/2017 චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂයේ මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත වාර්ෂිකව වාර්තා කිරීමට කටයුතු කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 6 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	අපහරණය කිරීමට අදාල වාහන 13ක් අතරින් වාහන 06 ක අපහරණ කටයුතු අවසන් කර ඇත. පහත සඳහන් වාහන 07 අපහරණය කළ යුතුව ඇත. ඒ සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග ගෙන ඇත. GI-7329 - යතුරුපැදිය 50-0305 - ඩබල් කැබ් 43-3017 - ලොරිබවුසරය 43-2967 - ලොරි බවුසරය 31-6753 - මෝටර් රථය NC MY - 8024] යුධ හමුදාව භාර දුන් NCMY - 8028] යතුරු පැදි	අපහරණය සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබී ඇති බැවින් පුවත්පත් දැන්වීමක් මඟින් ප්‍රසිද්ධ කර කඩිනමින් අපහරණය සඳහා පියවර ගෙන ඇත.

	දිස්ත්‍රික් විගණන හා කළමනාකරණ කමිටුවේදී ගත් තීරණය පරිදි නැවත තක්සේරු කිරීම සිදු කළ යුතුව තිබූ වාහන 05 තක්සේරු කර එම වාර්තා අනුමැතිය සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර 2024.08.12 දින අනුමැතිය ලැබී ඇත. 50 - 0305 කැබ් රථය දි.ලේ නමින් පවරා ගැනීම සඳහා අවශ්‍ය ලේඛන කොමිස්ත්‍රෝලර් ජනරාල් වෙත යොමු කර ඇත.	
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්ෂයකට වඩා වැඩි ණය ශේෂ ගණයට වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගේ ණය ශේෂ, සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ මෙන්ම විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන්ගේ ද ණය ශේෂ ඇතුළත් වන අතර වෙන වෙනම ඒ ඒ ණය ශේෂ පවතින නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කරන ලදී.	<u>වැඩ තහනම් කළ නිලධාරීන්ගේ ණය ශේෂ</u> ආර්.බී.පී.කේ.රත්නවීර මයා ග්‍රාම නිලධාරී මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැඩ තහනමට ලක් වූ මෙම නිලධාරියා විසින් ගෙවීම පැහැර හැර ඇති ණය ශේෂය පියවා ගැනීම සඳහා නිලධාරියාට එරෙහිව අංක 00495/M/21 යටතේ නීතිපති දෙපාර්තමේන්තුව විසින් අනුරාධපුර දිසා අධිකරණයේ පවරන ලද නඩුව 2024.06.19 දින කැඳවන ලද අතර නැවත 2024.10.04 දිනට නඩුව විභාගයට දින නියම කර ඇත. ආර්.එච්.කේ.වන්නිනායක මයා ග්‍රාම නිලධාරී ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැඩ තහනමට ලක් වූ මෙම නිලධාරියා විසින් ගෙවීම පැහැර හැර ඇති ණය ශේෂය පියවා ගැනීම සඳහා නිලධාරියාට එරෙහිව අංක 30483/M යටතේ නීතිපති දෙපාර්තමේන්තුව විසින් අනුරාධපුර දිසා අධිකරණයේ නඩු කටයුත්තක් සිදු කර ගෙන යන අතරතුර 2022.11.19 දින මෙම නිලධාරියා මිය ගොස් ඇත. නිලධාරියා මිය ගොස් ඇති බැවින් ඉදිරියේදී ඔහුට අදාළ ණය ශේෂය හා හිඟ පොළිය වැන්දඹු අනත්දරු අරමුදල් දීමනාවෙන් පියවා ගැනීමට නියමිතය.

		එච්.ඩබ්.ඩී.ජයසිංහ මයා කාර්මික නිලධාරී පදවිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැඩ තහනමට ලක් වූ මෙම නිලධාරියා විසින් ගෙවීම පැහැර හැර ඇති ණය ශේෂය 2023.11.30 දිනට පෙර පියවන ලෙස දන්වා මාගේ අංක ANU/DIST/2/7/2/B/37 හා 2023.11.23 දිනැතිව ලිපියක් යොමු කොට ඇති අතර මාගේ සමාංක හා 2024.01.03 දිනැතිව ගෙවීම පැහැර හැර ඇති ණය ශේෂය පියවන ලෙස අදාළ නිලධාරියා දැනුවත් කරන ලෙස දන්වමින් නිලධාරියාගේ කලත්‍රයා වන දුම්රිය ලිපිකරු එම්.පී.එස්.ලසන්ති තිලකරත්න මිය වෙත ලිපියක් යොමු කොට ඇත.එහෙත් නිලධාරියා විසින් ණය ශේෂය පියවීම පැහැර හරින බැවින් නීතිපති උපදෙස් විමසීමට නියමිතය. ඩී.පී.අනුර මයා ග්‍රාම නිලධාරී නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැඩ තහනමට ලක් වූ මෙම නිලධාරියා විසින් ගෙවීම පැහැර හැර ඇති ණය ශේෂය පියවන ලෙස දන්වමින් නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් විසින් අවස්ථා කිහිපයකදී නිලධාරියා දැනුවත් කොට ඇති අතර මාගේ අංක ANU/DIST/2/7/2/B/38 හා 2024.04.15 දිනැති ලිපිය මඟින් දින 14 ක් තුළ ණය ශේෂය පියවන ලෙස දැන්වූවද තවදුරටත් ගෙවීම පැහැරහරින බැවින් නීතිපති උපදෙස් විමසීමට නියමිතය. <u>සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂය</u> කේ.එම්.කේ.කාංගර මැණිකේ මිය පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සේවය හැර ගිය කළමනාකරණ සේවා නිලධාරී කේ.එම්.කේ.කාංගර මැණිකේ මියගෙන් අය විය යුතු ණය ශේෂය හා හිඟ පොළිය අදාළ නිලධාරිණිය විසින් 2023.03.23 දිනැති 595396 අංක දරණ හා 2023.04.20 දිනැති 595467 අංක දරණ රිසිට්පත් මඟින් පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් වෙත සම්පූර්ණයෙන්ම පියවා අවසන් කර ඇත.

		<u>විශ්‍රාම ගිය හා මිය ගිය නිලධාරීගේ ණය ශේෂ</u> එච්.එම්.එම්.ආර්.කේ.හේරත් මිය ප්‍රාදේශීය ලේකම් ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරමින් සිටියදී විශ්‍රාම ගොස් ඇති මෙම නිලධාරිණියගේ ණය ශේෂය 2024 අප්‍රේල් මාසය තුළ නිලධාරිණියගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් පියවා ගන්නා ලදී.
මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.	2022 වර්ෂයේ මුල් කාලයේදී රටේ පැවැති දේශපාලන, ආර්ථික හා සමාජීය අර්බුද හමුවේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව පැවැත්වීමට ගරු සම සභාපතිතුමන්ලා දින ලබා නොදීම හේතුවෙන් කමිටු නොපැවැත්වුණි. එහෙත් ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති ලෙස පත්වීමෙන් පසු, පැවැති දේශපාලන අස්ථාවරත්වය පහව යාමෙන් අනතුරුව 2022.10.11 දින සම්බන්ධීකරණ කමිටු රැස්වීමක් පැවැත්විණි. එමෙන්ම වර්ෂය අගභාගයේදී සංවර්ධන කටයුතු ක්‍රියාත්මක නොවුණු හෙයින්, සංවර්ධන ප්‍රගතිය හා ගැටළු සාකච්ඡා කිරීමේ අවශ්‍යතාවයක්ද පැන නොනැගුණු හෙයින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් ද පැවැත්වීමේ අවශ්‍යතාවයක් මතු නොවුණි.	2023 වර්ෂයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් 03ක් හා 2024 වර්ෂයේ මේ වන විට කමිටු රැස්වීම් 02ක් ද පවත්වා ඇත.
දිස්ත්‍රික් ලේකම් විසින් කැඳවනු ලබන ප්‍රාදේශීය ලේකම් සමුළුව මාසිකව පවත්වා නොතිබුණි.	ප්‍රාදේශීය ලේකම් සමුළු 02 ක් 2022.01.28 හා 2022.03.04 දිනවල නොච්චියාගම සහ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දී පවත්වන ලදී. එම වර්ෂය තුළ රටෙහි පැවැති දේශපාලන, සමාජයීය හා ආර්ථික අස්ථාවර තත්ත්වය හේතුවෙන් අත්‍යවශ්‍ය සේවා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දීමට සිදු වූ බැවින් ප්‍රාදේශීය ලේකම් සමුළු පැවැත්වීම සීමා කිරීමට සිදු වීම.	2023 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් සමුළු 05 ක් හා 2024 වර්ෂයේ මේ වන විට එක් ප්‍රාදේශීය ලේකම් සමුළුවක් පවත්වා ඇත. ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්කිරීමත් සමඟ මැතිවරණ කටයුතු සඳහා ප්‍රමුඛතාව ලබා දීමට සිදුවීම මත මැතිවරණයෙන් පසුව නැවත පැවැත්වීමට නියමිතය.
දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස්වී නොතිබුණි.	දිස්ත්‍රික් නිවාස සංවර්ධන කමිටුවේ ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා නිවාස සංවර්ධන අධිකාරිය විසින් මෙම කමිටුව පවත්වන අතර එබැවින් එම ආයතනයේ ඉල්ලීම පරිදි කමිටු පවත්වන ලදී . ඒ අනුව 2022 වර්ෂය සඳහා නිවාස සංවර්ධන කමිටුව දෙවරක් රැස්වී ඇත.	2023 වර්ෂයේ නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් නොවීම හේතුවෙන් නිවාස කමිටුව මාසිකව පැවැත්වීම අවශ්‍ය නොවන බව නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරු විසින් දන්වා ඇති බැවින් අවශ්‍යතාවය පරිදි කමිටුව පවත්වා ඇත. මෙම වසරේ මේ වන විට එක් කමිටුවක් පවත්වා ඇත.

දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස් වී නොතිබුණි.	දිස්ත්‍රික් පොහොර කමිටුව කන්නය ආරම්භයත් සමඟ පවත්වන අතර, එමඟින් වගා භූමි ප්‍රමාණය හා අවශ්‍ය පොහොර ප්‍රමාණය තීරණය කරනු ලැබේ. මාසිකව පැවැත්වෙන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී උක්ත පොහොර කමිටුවට සම්බන්ධ සියලු නිලධාරීන් මෙන්ම ගොවි නියෝජිතයින් සහභාගි වන බැවින් එහිදී පොහොර සම්බන්ධ ගැටළු සමාලෝචනයට ලක් කරනු ලබයි. එක් කන්නයක් තුළදී, අවම වශයෙන් පොහොර සැපයීම් කරන ආයතන හා ක්ෂේත්‍රයේ අලෙවි කරනු ලබන අලෙවි නියෝජිතයින් සමඟ රැස්වීම් පවත්වා අවශ්‍ය පියවර ගනු ලබයි. විශේෂ අවශ්‍යතාවයක් මතු වුවහොත්, පොහොර කමිටුව පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.	රැස්වීම් පැවැත්වීමට ප්‍රතිපාදන සීමා වී ඇති බැවින් මෙන්ම, නිලධාරීන්ගේ හා කමිටු නියෝජිතයින්ගේ ගමන් පහසුකම් සලසා ගැනීමේදී මතුවී ඇති ගැටළු නිසාවෙන්ද උක්ත රැස්වීම පැවැත්වීම සීමා වී ඇත. කෙසේ වුවද මේ වන විට 2024 වර්ෂය සඳහා කමිටු රැස්වීම් 02ක් පවත්වා ඇත.
හදුනාගත් තිරසර අරමුණු ඉටුකර ගැනීම සඳහා ලභා කරගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	සාමාන්‍යයෙන් වාර්ෂික අයවැය ප්‍රතිපාදන මත විවිධ වැඩසටහන් යටතේ ග්‍රාමීය මට්ටමෙන් විවිධ පරාසයන් තුළ රු.10,000 ක පමණ සිට ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා කාර්ය සාධන ඉලක්ක නියම කිරීම ප්‍රායෝගිකව නිශ්චය කළ නොහැකි ගැටලුකාරී තත්ත්වයක් බැවින් එවැන්නක් සිදු නොකරන ලදී.	මෙම වසරේ ක්‍රියාත්මක කිරීමට යෝජිත විවිධ වැඩසටහන් මඟින්, හදුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා අංශ හා නිලධාරී මට්ටම්න් ඉලක්ක තීරණය කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කිරීමට සැලසුම් කර ඇත.
2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණි.	2022 වර්ෂය වන විට මෙම කාර්යාලය සඳහා පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කර නොතිබුණි.	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය 2024 වර්ෂයේ සකස් කිරීමට කටයුතු කර ඇත.
ආයතනයේ පුරවැසි සේවා /සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.		පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියෙහි දැක්වෙන අයුරින් අදාළ කාර්යයන් ඉටුකර දෙන්නේද යන්න සම්බන්ධව ඒ ඒ අංශභාර මාණ්ඩලික නිලධාරීන් මඟින් පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් සැලසුම් කර ඇත.
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.	2022 වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්ම සකස් කර නොතිබුණි.	2024 වර්ෂය සඳහා සකස් කර ඇත.

සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අතිරේක පුහුණුවක් නියම කර නොතිබුණි.		2023 වර්ෂයේ මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 01/2023 චක්‍රලේඛය අනුව ඒ ඒ නිලධාරීන් විසින් සේවා ව්‍යවස්ථාවට අනුව සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු අනිවාර්ය පුහුණුවීම් සඳහා පමණක් අවස්ථා ලබා දිය යුතු බව දැන්වීම හේතුවෙන් අමතර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොමැති වුණි. මෙම වසරේ පවත්නා සම්පත් යොදා ගනිමින් පුහුණු වැඩසටහන් සිදු කිරීමට සැලසුම් කර ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	2022 වර්ෂයේ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල පැවැති අඩුපාඩු හේතුවෙන් විගණන මතය යටත්ව මට්ටමේ මතයක් විය.	2023 වර්ෂයේ විගණන මතය, සත්‍ය හා සාධාරණ බවට පැහැදිලි මතයක් ලැබී ඇත.
හදුනාගත් කාර්ය දර්ශකයේ ලඟාවීම 24% ට වඩා අඩු ප්‍රමාණයෙන් විය.	2022 වර්ෂයේ මෙම කාර්යාලය විසින් ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රතිශතය 50% ත් 74 % ත් අතර විය.	2023 වර්ෂයේ ද මෙම කාර්යාලය විසින් ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රතිශතය 50% ත් 74 % ත් අතර විය.
දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට 01 බැගින් රැස්වී නොතිබුණි.	රටෙහි පැවැති දේශපාලන, සමාජයීය හා ආර්ථික අස්ථාවර තත්ත්වය හේතුවෙන් 2022 වර්ෂයේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් පවත්වා නැත.	
ළමා අයිතිවාසිකම් පිළිබඳ දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුව කාර්තුවකට 01 බැගින් රැස්වී නොතිබුණි.	ළමා අයිතිවාසිකම් පිළිබඳ ළමා සංවර්ධන කමිටු පළමු කාර්තු රැස්වීම 2022.03.11 දින පවත්වා ඇති අතර එම වර්ෂය තුළ රටෙහි පැවැති දේශපාලන, සමාජයීය හා ආර්ථික අස්ථාවර තත්ත්වය හේතුවෙන් අනෙක් කාර්තුවල කමිටු රැස්වීම් පවත්වා නොමැත.	2023 වර්ෂයේ කාර්තු රැස්වීම් 04ම පවත්වා ඇති අතර 2024 වර්ෂයේ ද මේ වන විට මුල් කාර්තු 02හි රැස්වීම් පවත්වා ඇත.
2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත අනුව ආපදා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.	2022 වර්ෂයේදී ප්‍රාදේශීය ආපදා කමිටු 04ක් මිහින්තලය, නොච්චියාගම, මහවිලච්චිය හා ගලෙන්බිදුනුවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි පවත්වා ඇත. එමෙන්ම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව පැවැති ආපදා තත්ත්වය මත අවශ්‍යතාව පරිදි වර්ෂයකට එක් වරක් රැස්වීමට කටයුතු යොදා ඇත.	2023 වර්ෂයේ දිස්ත්‍රක් ආපදා කමිටුව 2023.11.14 දින පවත්වා ඇති අතර ප්‍රාදේශීය කමිටු අවශ්‍යතාව මත මහවිලච්චිය හා නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල පමණක් පවත්වා ඇත. මෙම වර්ෂය සඳහා ඉදිරියේදී පවතින තත්ත්වය මත අවශ්‍යතාව පරිදි කමිටු පැවැත්වීමට නියමිතය.

සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2022.04.26 දිනැති මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව පුහුණු පැවැත්වීම නැවැත්වීම හා එවකට රටෙහි පැවැති දේශපාලන, සමාජයීය හා ආර්ථික අස්ථාවර තත්ත්වය මීට හේතු විය.	2023 වර්ෂයේ මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 01/2023 චක්‍රලේඛය අනුව ඒ ඒ නිලධාරීන් විසින් සේවා ව්‍යවස්ථාවට අනුව සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු අනිවාර්ය පුහුණුවීම් සඳහා පමණක් අවස්ථා ලබා දිය යුතු බව දැන්වීම හේතුවෙන් අමතර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොමැති වුණි. මෙම වසරේ පවත්නා සම්පත් යොදා ගනිමින් පුහුණු වැඩසටහන් සිදු කිරීමට සැලසුම් කර ඇත.

.....

ඊ.එම්.සී.හේරත්.
ප්‍රධාන ගණකාධිකාරී(වැ.බ),
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අනුරාධපුර.

ඊ.එම්.සී. හේරත්
ප්‍රධාන ගණකාධිකාරී (වැ.බ.)
අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් වෙනුවට

.....

කේ.ජී.ආර්.විමලසූරිය.
දිසාපති / දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අනුරාධපුර.

කේ.ජී.ආර්. විමලසූරිය
දිසාපති/දිස්ත්‍රික් ලේකම්
අනුරාධපුර.

ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් සෞඛ්‍යමය අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
"නිල මැදුර" ඇල්විටිගල මාවත, කොළඹ 05.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)

අග්‍රාමාත්‍යතුමා සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය